# ශ්‍රී මහා බෝධිය ශ්‍රීලංකාවට වැඩමකළ උඳුවප් පොහොය



## සඟමිත් තෙරණින් වහන්සේ

සම්බුදු දහම් හා නන් සිරියෙන් සුසැදී
දඹදිව් තලෙහි රජ කුමරියකව ඉපදී
අත්හැර සියළු සම්පත් පින් පල පරිදී
මොක්සුව පතා පත්වී දිවියට පැවිදී

සොහොයුරු මිහිඳු හිමි ලක්දිව වැඩම කර
පිහිටුවමින් සසුන හදකින් කුළුණු බර
සදහම් දෙසා වීමට සසරින් එතෙර
සැරසුණ දනන් සිත් පිනවූ පැවිදි කර

යුවරජ බිසව් අනුලා සහ නොයෙක් කතුන්
පැතුවෙන් පැවිදිවන්නට අවසර සැදැ හෙන්
ඉටුකර දෙනු පිණිස අයැදුම මිහිඳු හිමින්
ඇරැයුම් කළෝ සඟමිත් මෙහෙණියට සැනින්

මාහිමි මිහිඳු කළ ඒ ඇරැයුම සතු ටින්
පිළිගෙන පිය රජුගෙ නිසි උවදෙස් ලබ මින්
සිරිමා බෝධි ශාඛාවක් වැඩම කරන්
තෙරණිය සිරිලකට වැඩියෝ සපිරි වරින්

මහමෙව්නාවෙ බෝහිමි රෝපණය කර
අනුලා බිසව් හා පිරිවර පැවිදි කර
සඟමිත් තෙරණි බුබුළුවමින් සසු නඹර
වැඩසිටි සේක ඉටුකර මෙහෙයක් පවර

බෝ හිමි වැඩමවාගෙන විත් ලක් බිමට
ලොකු සම්පතක් හිමිකර දුන් බොදු දනට
සඟමිත් තෙරණියන් සිහිකර ඒ නමට
බැතිමල් පුදමු අපි උඳුවප් පොහො දිනට

*විශ්‍රාම ලත් විදුහල්පතිනිය*
♦ ***ප්‍රේමා අදිකාරී***
Morden, Surrey **UK**

# හික්ගොඩ ඛේමානන්ද නම් ආදර්ශමත් භික්ෂූන්වහන්සේට නිවන්සුව ප්‍රාර්ථනාකරමු !



**නි**ව්යෝර්ක් නුවර ස්ට්‍රැටන් දූපතේ බෞද්ධ විහාරස්ථානයේ කලක් වැඩවිසූ පූජ්‍ය හික්ගොඩ ඛේමානන්ද මා හිමිපාණන් නොබෝදා අපවත්වීම නිමිත්තෙන් එංගලන්තයේ නැගණහිර ලන්ඩන් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ලුම්බිණී විහාරයට රැස්වූ දායක පිරිස මතක වස්ත්‍ර පූජාකර උන් වහන්සේට නිවන්සුව පැතීමේ පිංකමක් පැවැත්වූහ.

විහාරාධිපති මාකුරේ මංගල හිමියන් ප්‍රමුඛ ශ්‍රීලාංකික සහ තායි භික්ෂූන් වහන්සේලා විසින් සම්ප්‍රදායික ආගමික පිළිවෙත් ඉටුකරනු ලැබීමෙන් අනතුරුව, අපවත්වූ ඛේමානන්ද හිමියන් ලුම්බිණී විහාරය පටන්ගත් මුල් අවධියේ එහි වැඩ සිටිමින් පළාතේ ලාංකික බෞද්ධ ජනතාවට ආගමික වතාවත් හා අනුශාසනා කිරීමෙන් මහඟු සේවයක් ඉටු කළ බව මංගල හිමියෝ කෘතඥ පූර්වකව පැවසූහ.

අපවත්වූ ඛේමානන්ද හිමියන් අතීතයේ ලන්ඩන් බෞද්ධ විහාරයේ වැඩවිසූ සමයේ උන්වහන්සේ සමග එහි විසූ බඹර කොටුවේ ආනන්ද මංගල හිමියන්ද මෙම පිංකමට සහභාගිවී සිටි අතර ඒ හිමියෝ ඛේමානන්ද තෙරණුවන් ගේ පැවිදි ජීවිතය ගැන කෙටි ගුණකථනයක් කරමින් මෙසේ පැවසීය.

“ ඛේමානන්ද හාමුදුරුවො නිහතමානී පරෝපකාරීබවින් සපිරුණු භික්ෂූන්වහන්සේ නමක්. උන්වහන්සේ මුළු ජීවිතයේම මස් මාංශවලින් වැළකී සිටියා. ලංකාවේ ප්‍රකට අවිහිංසාවාදි යෙකු වූ ආචාර්ය අදිකාරම් මහතාව සමීපව ඇසුරු කළා.”

“ සිංහළ සාහිත්‍යය සහ බෞද්ධ සංස්කෘතිය ගැන මනා අවබෝධයක් ඛේමානන්ද හිමියන්ට තිබූ අතර නිව්යෝර්ක් නුවර පළවූ බෝසත් සඟරාව සංස්කරණය කිරීමෙන්ද වෙනත් අනේක පුවත්පත් හා සඟරාවලට ලිපි සැපයීමෙන්ද ඉමහත් මෙහෙවරක් ඉටු කළා.”

වසර 50 කට අධික කාලයක් පුරා ඛේමා- නන්ද හිමියන් හා සමීප ආශ්‍රයක් පැවැත්වූ මම උන්වහන්සේගේ ආදර්ශමත් ගුණ සමුදාය දැන සිටිමි. සම්ප්‍රදායිකව හිමිවන්නට තිබුණු ඉසුරු මුණි විහාරයේ අධිපතිධුරයද පිළිකෙව් කළ උන්වහන්සේ ඉතිහාස ගතවිය යුතු භික්ෂුවකි.

පූජ්‍ය හික්ගොඩ ඛේමානන්ද හිමිපාණන්ට නිවන්සුව අත්වේවා!

♦ ***ආර්. ඒ. විමලසේකර***
*මහජන සම්බන්ධතා නිලධාරි*
*නැගණහිර ලන්ඩනයේ ලුම්බිණී විහාරය*


**Duke's Court Travel** DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £320 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £326 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £355 + Taxes |
| Emirates | Emirates | fr £737 + Taxes |
| ETIHAD AIRWAYS | Etihad Airways | fr £495 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

www.easy-flights.tv

020 8748 3535

3045 ATOL PROTECTED AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS IATA

204 King Street, London W6 0RA


## දෙවර්ෂ පූර්ණ සිහිකිරීමයි!

# වජිරඤාණ නායක ස්වාමීන් වහන්සේ



ලන්ඩන් බෞද්ධ විහාරයේ විහාරාධිපතිව වැඩ විසූ පූජ්‍ය ආචාර්ය මැදගම වජිරඤාණ නාහිමියන් අපවත්වී දෙවසරක් පිරීම නිමිත්තෙන් **2008** දෙසැම්බර් මස **14** වන ඉරුදින දහවල් **11** සිට **1** දක්වා විශේෂ දානමය පිංකමක් සහ ගුණ සැමරීමක් ලන්ඩන් බෞද්ධ විහාරස්ථානයේ දී සිදු කෙරේ. මෙම අවස්ථාවට සහභාගිවන ලෙස සියළු පින්වතුන්ට කෙරෙන ආයාචනයයි මේ.

**වජිරඤාණ නාහිමියන්ට නිවන් සුව පතමු !**


මේ උත්සව සමයේ ඔබගේ නෑදෑ හිතමිතුරන්ට මුදල් යැවීම සඳහා එක්සත් රාජධානියේ විශ්වාසවන්තම ශ්‍රී ලංකීය සමූහ ව්‍යාපාරය සමග එක්වන්න.



හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරි, අසිරිමත් නත්තලක් සහ සුබ නව වසරක් වේවා!

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ සේලාන් බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් මුදල් ලබාගැනීමේ පහසුව.
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම.
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම.
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීම.

Transfer Fees From only £5

COMMERCIAL BANK | BOC BANK OF CEYLON | HNB | HSBC | සම්පත් බැංකුව SampathBank | PEOPLE'S BANK | Standard Chartered

020 8886 4488

Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

MCG